මගේ අංකය / எனது இல. / My No. } විවැ/පා10/සං.නි/ස්.මා/2021/II

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................

දිනය / திகதி / Date } 2023.07.07

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ප්‍රාදේශීය ලේකම්වරුන්/
ප්‍රධාන කාර්යාලයේ අංශභාර මාණ්ඩලික නිලධාරින් මගින්,
විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අනුයුක්ත සියලුම නිලධාරින්

**දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය ඒකාබද්ධ සේවයේ හා අභ්‍යන්තර වාර්ෂික නොවන ස්ථාන මාරු සඳහා ඉල්ලීම් ඉදිරිපත් කිරීම සම්බන්ධවයි.**

මෙම දෙපාර්තමේන්තුව යටතේ සේවයේ නියුතු නිලධාරීන්/සේවකයින් විසින් උක්ත කරුණු සඳහා වන ඉල්ලීම් යම් අඩුපාඩු සහිතව මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම තුලින් ඇතිවන ප්‍රමාද හා අපහසුතා වලක්වා ගැනීම සඳහා පහත පරිදි කටයුතු කරන මෙන් තම කාර්ය මණ්ඩලයේ සියලුදෙනා දැනුවත් කරන මෙන් කාරුණිකව දන්වමි.

I. සෑම ස්ථාන මාරු අයදුම්පතක්ම නිවැරදිව සම්පූර්ණ කර තම අංශ ප්‍රධානි මගින් සුදුසු නිර්දේශ සමඟ ඉදිරිපත් කළ යුතුය.

II. වාර්ෂික අභ්‍යන්තර ස්ථාන මාරු ඉල්ලුම් කිරීමේදී ඒ සඳහා අදාළ වන නිවැරදි අයදුම්පත මගින්ද, ඒකාබද්ධ සේවයේ වාර්ෂික නොවන ස්ථාන මාරු / සුහද ස්ථාන මාරු සඳහා ඉල්ලුම් කිරීමේදී ඒකාබද්ධ සේවා චක්‍රලේඛ අංක 02/2015 අනුකූලව CS/T/01 අයදුම්පත මගින්ද ඉල්ලුම් කළ යුතුය.

III. මෙම CS/T/01 අයදුම්පත පිරවීමේදී ආ කොටසේ වර්තමාන සේවා ස්ථානය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව ලෙසද, වත්මන් සේවා ස්ථානයේ මුළු සේවා කාලය විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ මුළු සේවා කාලය ලෙසද දැක්විය යුතුය. එසේම ආසන්න වසර 15ක සේවා කාල දැක්වීමේදී විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව යටතේ සේවය කළ අනු කාර්යාල සටහන් කරන අවස්ථාවේදී, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව - ප්‍රධාන කාර්යාලය/................. ප්‍රාදේශීය ලේකම් කාර්යාලය /දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ලෙස දක්වා එම කාර්යාල වල සේවා කාල දැක්විය යුතුය.

IV. ඒකාබද්ධ සේවයේ සුහද ස්ථාන මාරු සඳහා ඉල්ලීම් කරන්නේ නම්, අදාළ අනුප්‍රාප්තික නිලධාරියා අවම වශයෙන් වසර 02ක් මෙම දෙපාර්තමේන්තුව යටතේ සේවය කරනු ලබන බව, රා.ප.ච. 14/2022 අනුව දේශීය හෝ විදේශීය නිවාඩු ලබා නොගන්නා බවත් සනාථ කර විධිමත් ජීව දත්ත පත්‍රිකාවක් සමඟ තම ආයතන ප්‍රධානියා මගින් ඉල්ලීම ඉදිරිපත් කළ යුතුය. ප්‍රාදේශීය ලේකම් කාර්යාල/ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වල සේවයේ නියුතු නිලධාරීන් තම අයදුම්පත් එම කාර්යාල මගින් සෘජුවම ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු නොකළ යුතු අතර, එම කාර්යාල භාර මාණ්ඩලික නිලධාරියා (ප්‍රාදේශීය ලේකම්/දිස්ත්‍රික් ලේකම්) මගින් නිර්දේශ සහිත ආවරණ ලිපියක් සමඟ මෙම දෙපාර්තමේන්තුවේ පාලන අංශය වෙත ඉදිරිපත් කළ යුතුය.

V. සෑම අයදුම්පතක් සමඟම යොමුකල යුතු සියලු ලේඛනයන්හි මුල් පිටපතට අමතරව ඡායා පිටපතක්ද එවිය යුතු වේ.

VI. මේ සම්බන්ධයෙන් ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීති සංග්‍රහය හා චක්‍රලේඛ මගින් ලබා දී ඇති උපදෙස් පිළිබඳව ද අවධානය යොමු කරන ලෙස අවධාරණය කරමි.

02. ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී එකී අයදුම්පත්වල අසම්පූර්ණතාව හා තොරතුරුවල නිරවද්‍යතාවය තහවුරු නොවීම මත සිදුවන ප්‍රමාදයන් හා ගැටළු අවම කර ගැනීම සඳහා මෙම මාර්ගෝපදේශයන් තරයේ අනුගමනය කරනු ඇතැයි අපේක්ෂා කරමි.

**ඒ ජගත් ඩී ඩයස්**
විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්